## පළමුවන කියැවීම

නික්මයාම 24:3-8

නික්මයාම පොතෙන් ගත් පාඨයකි.

"මෙය වනාහි සමිඳුණන් වහන්සේ ඔබ සමග කළ ගිවිසුම ස්ථිර කරන රුධිරය වේ." මෝසෙස් ද ඇවිත් සමිඳුණන් වහන්සේගේ සියලු ආඥා හා නියෝග සෙනඟට දන්වී ය. සියලු සෙනඟ ද එක හඬින් උත්තර දෙමින්, "සමිඳුණන් වහන්සේගේ ආඥා සියල්ල ම අපි ඉටු කරන්නෙමු." යි කීහ. ඉන්පසු ඔහු උන් වහන්සේගේ ආඥා සියල්ල ම ලියා තැබීය. පසුදින උදය අලුයම ඔහු නැගිට කන්ද, පාමුල පූජාසනයක් ද ඉශ්රායෙල් ගෝත්‍ර දෙළොස අනුව ශීලාස්ථම්භ දෙළොසක් ද ඉදි කළේ ය. පසුව ඔහු ඉශ්රායෙල් ජනයා අතරෙන් තරුණයන් යැවී ය. ඔව්හු දවන යාග පූජා හා ගවයන් මරා, සහභාගිකමේ පූජා ද සමිඳුණන් වහන්සේට ඔප්පු කළහ. මෝසෙස් සතුන්ගේ ලෙයින් දෙකෙන් කොටසක් ගෙන එය බඳුන්වල දමී ය. ලෙයින් අඩක් පූජාසනය මත ඉස්සේය. පසුව ඔහු ගිවිසුම් පොත රැගෙන සෙනඟට ඇසෙන ලෙස එය කියවී ය. ඔව්හු ද පිළිතුරු දෙමින් "සමිඳුණන් වහන්සේ වදාළ සියල්ල ම අපි ඉටු කරන්නෙමු." යි කීහ. එවිට මෝසෙස් ලේ රැගෙන, සෙනඟ මත ඉසිමින් "මේ වනාහි සමිඳුණන් වහන්සේ මෙකී ආඥා ඔබට දෙමින්, ඔබ සමග කළ ගිවිසුම ස්ථිර කරන ලේ ය." යි පවසී ය.

දේව වාක්‍යය එසේ ය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 116:12-13,15-18

පිළිතුර: මම ගැළවීමේ කුසලාන ගෙන සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

ගීය: සමිඳුන් මා හට කළ සියලු යහපත්කම් ගැන එතුමන්ට මම කුමක් පුදම් ද? මම ගැළවීමේ කුසලාන ගන්නෙමි. සමිඳුන්ගේ නාමයෙන් යාච්ඤා කරන්නෙමි.

සැදැහැවතුන්ගේ මරණය සමිඳුන් අබියස අගනේය. සමිඳුනි, මම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. සැබැවින්ම ඔබේ මෙහෙකරුවෙක් වෙමි. ඔබේ දාසියගේ පුත්‍රයා වෙමි. ඔබ මාගේ බැඳුම් මිදූ සේක.

මම ඔබට ස්තුති පූජාව පුදන්නෙමි. සමිඳුන්ගේ නාමය අමතා අයදින්නෙමි. එසේය සමිඳුන්ගේ මුළු සෙනඟ ඉදිරියේ මාගේ බාර හාර ඉටු කරන්නෙමි.

## දෙවන කියැවීම

හෙබ්‍රෙව් 8:11-15

හෙබ්‍රෙව්වරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් කොටසකි.

**ක්‍රිස්තුස් වහන්සෙගේ සිරි ලෙයින් ඔබේ හෘදය සාක්ෂිය පිරිසිදු කරන ලබන්ටන් ය.**

එහෙත් ක්‍රිස්තුස් වහන්සේ දැනට ම ඇති යහපත් දේ පිළිබඳ උත්තම පූජකයාණන් වශයෙන් පැමිණ සිටින සේක. උන් වහන්සේ වඩා උතුම්, වඩා සම්පූර්ණ, මිනිස් අතින් නොසැදූ, එනම් මේ භෞතික මැවිල්ලට අයිත් නොවන මණ්ඩපයේ පූජකයාණෝ ය. උන් වහන්සේ එළුවන්ගේත් වස්සන්ගේත් ලෙයින් නොව තමන්ගේ ම ලෙයින් අප උදෙසා සදාතන විමුක්තිය ලබා සදහටම එක් වරක් ශුද්ධස්ථානයට ඇතුළු වූ සේක. මන්ද, වත් පිළිවෙත් අනුව අපවිත්‍ර යයි සළකන අය මත

එළුවන්ගේත් ගොනුන්ගේත් ලේ ද, එළ වැස්සියකගේ අළු ද ඉසීමෙන් ඔව්හු පාරිශුද්ධිය ලබන්නහු ය. එසේ නම් ජීවමාන දෙවියන් වහන්සේට සේවය කරන පිණිස ඔබගේ හෘදය සාක්ෂිය නිෂ්ඵල ක්‍රියාවලින් පිරිසිදු කරනු ලැබීම, සදාතන ආත්මයාණන් මගින් තමන් ම කැළලක් නැතිව දෙවියන් වහන්සේට පූජා වූ ක්‍රිස්තුස් වහන්සේගේ ලේ කරණකොටගෙන, ඊටත් ඉතා වැඩියෙන් පිරිසිදු නොවන්නේ ද? මේ කාරණය නිසා, කැඳවනු ලැබූවන්ට සදාතන උරුමයේ පොරොන්දුව ලැබෙන පිණිස උන් වහන්සේ අලුත් ගිවිසුමක මැදහත්කාරයාණෝ වන සේක. එසේ වන්නේ පළමුවන ගිවිසුමේ කාලයේ දී කළ පාප ක්‍රියාවලින් මුදනු ලැබීම පිණිස මරණයක් සිදු වූ බැවිනි. දේව වාක්‍යය එසේ ය.

## සාධුකාරය

ජුවාම් 6:51

ආලේලූයා! ආලේලූයා!
"ස්වර්ගයෙන් පහළවන ජීවන දායක භෝජනය මම ය. යමෙක් මේ භෝජනය වැළඳුවොත් ඔහු සදාකල් ජීවත් වන්නේ ය." යි ස්වාමින් වහන්සේ වදාළ සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මාක් 14:12-16,22-26

සුවිශේෂක ශුද්ධ වූ මාක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"මෙය මාගේ ශරීරය ය. මෙය මාගේ රුධිරය ය."**

පාස්කු බැටළු පෝතකයා පූජා කරනු ලබන, නුමුහුන් පූප මංගල්‍යයේ පළමු වන දින ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයෝ, "පාස්කු භෝජනය වළඳන පිණිස අප ගොස් කොතැන පිළියෙල කරනවාට ඔබ කැමැති සේක්ද" යි උන්වහන්සේගෙන් ඇසූහ. එවිට උන්වහන්සේ තම ශ්‍රාවකයන් දෙදෙනෙකු යවමින්, "නුවරට යන්න; ගිය විට, වතුර කළයක් ගෙන යන මිනිසෙක් ඔබට හමුවන්නේය; ඔහු පස්සේ යන්න. ඔහු යම් ගෙදරකට ඇතුළු වන්නේ ද ඒ ගෙහිමියාට කතා කොට, 'මාගේ ශ්‍රාවකයන් සමඟ පාස්කු භෝජනය වළඳන පිණිස මට වෙන් කළ කාමරය කොයිද කියා ස්වාමින් වහන්සේ අසන සේකැ' යි කියන්න. එවිට සකස් කොට සූදානම්ව ඇති ලොකු උඩුමහල් කාමරයක් ඔහු ඔබට පෙන්වනු ඇත. එහි අපට පාස්කු භෝජනය පිළියෙළ කරන්නැ" යි ඔවුන්ට වදාළ සේක. ශ්‍රාවකයෝ පිටත්ව නුවරට ගියහ. උන්වහන්සේ ඔවුන්ට කී ලෙස සියල්ලම සම්බ විය; ඔව්හු ද පාස්කු භෝජනය පිළියෙළ කළහ. ඔවුන් ආහාර වළඳමින් සිටියදී උන්වහන්සේ පූප ගෙන, ආශිර්වාදය පවසා, ඒවා කඩා ඔවුන්ට දී, "ගන්න, මේ මාගේ ශරීරය ය" යි වදාළ සේක. උන්වහන්සේ කුසලානක් ද ගෙන, තුති පුදා, ඔවුන්ට දුන් සේක. සියල්ලෝම එයින් පානය කළහ. තවද උන්වහන්සේ ඔවුන්ට කතා කොට, "මෙය බොහෝ දෙනා වෙනුවෙන් වගුරුවනු ලබන මාගේ ගිවිසුම් - රුධිරය වේ. සැබැවින්ම මම ඔබට කියමි, දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි දී මම නැවත මිදියුස පානය කරන දිනය එන තෙක්, මම මේ මිදියුස යළිත් පානය නොකරන්නෙමි" යි වදාළ සේක. ඔව්හු ගීතයක් ගයා ඔලීව කන්දට නික්ම ගියහ. සුවිශේෂ වාක්‍යය එසේ ය.